ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

# ශාන්ත අන්තෝනි දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා ඉන්දියානු බැතිමත්තු මහත් උනන්දුවකින් සහභාගී වෙති

ඉන්දියානු බැතිමතුන් 2500කට ආසන්න පිරිසක් 2023 මාර්තු 2-4 දිනයන් හිදි පැවති කච්චතිවු ශාන්ත අන්තෝනි දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා සහභාගී වූ අතර ඒ අතරින් වැඩි දෙනෙක් පූජ්‍ය පක්ෂය නියෝජනය කළ අය සහ ධීවරයන් වූහ. ශ්‍රී ලාංකික බැතිමතුන් 3000ක් පමණ ද මෙම වාර්ෂික මංගල්‍යය සඳහා සහභාගී වූහ.

2. ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා 2023 මාර්තු 3 වන දින ඉන්දීය වන්දනාකරුවන් පිළිගත් අතර එදිනම විශේෂ යැදුම් සහ සවස් වරුවේදී පූජාව පැවැත්විණ. 2023 මාර්තු 4 වන දින ඉන්දීය සහ ශ්‍රී ලංකා පූජකවරුන් විසින් ධීවරයන්ගේ භාරකාර ශාන්තුවරයා වන පාදුවා හි ශාන්ත අන්තෝනි මුනිතුමා වෙනුවෙන් විශේෂයෙන් කැපකළ පූජාවක් පවත්වන ලදී. ඉන් අනතුරුව සාම්ප්‍රදායික අයුරින් වාර්ෂික මංගල්‍යය පැවැත්විණ.

3. උත්සවශ්‍රීය තවත් ඔප් නංවමින් ඉන්දියානු සහ ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගේ ශිල්පීය දස්කම් රැගත් භාණ්ඩ ප්‍රදර්ශනය කරන සහ අලෙවි කරන කුටි රැසක් ද මෙහිදී පැවැත්විණ.

4. මෙම වසරේ මංගල්‍යය සඳහා ඉන්දීය රජය විසින් මූල්‍ය සහයෝගය ලබා දේ. යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් රාකේෂ් නටරාජ් මහතා සහ කොන්සියුලර් ජෙනරාල් කාර්යාලයේ අනෙකුත් නිලධාරීහු මෙම උත්සවයේ ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ.

5. වාර්ෂිකව පැවැත්වෙන මෙම මංගල්‍යය සඳහා සෑම වසරකම ඉන්දීය බැතිමත්තු මහත් උනන්දුවකින් සහභාගී වෙති. පසුගිය වසර දෙකෙහි මංගල්‍යය සඳහා කොවිඩ්-19 වසංගතය බාධා මතු කළේය. මෙම මංගල්‍යය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර පවතින ශක්තිමත් සබඳතා පිළිඹිබු කරන අතර සමුද්‍රීය අසල්වැසියන් වන දෙරට ධීවර ප්‍රජාව අතර සමීප අන්තර්ක්‍රියා සඳහා මඟ පාදයි.

***

**කොළඹ**
**2023 මාර්තු 4**